# ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින්

# 8.0

# ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින්

හොඳ සෞඛ්‍ය සම්පන්න සමාජයක් රටක අවශ්‍යතාවයකි. එනිසා සමාජයේ සිටින ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ ඔවුනට හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමටත්, අනෙකුත් පහසුකම් සැලසීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමටත්ය.

ශ්‍රී ලංකාවේ දාහතරවන ජන හා නිවාස සංගණනයේ දී ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයන්ගේ තොරතුරු එක්රැස් කරන ලදී. මෙහි දී බාල, තරුණ, මහළු යන සෑම වයසකටම අයත් පුද්ගලයෙකුගෙන්ම තමාගේ එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාමට බලපාන යම් ශාරීරික හෝ මානසික අපහසුතා ඇත් ද යන්න සොයා ගැනීම සඳහා කෙටි ප්‍රශ්න හයක් අසන ලදී. ඒ යටතේ පෙනීම, ඇසීම, ඇවිදීම හෝ පඩි නැගීම, මතක තබා ගැනීම හෝ යමකට අවධානය යොමු කිරීම, ඇඳුම් ඇඳ ගැනීම හෝ ඇඟ සෝදා ගැනීම වැනි තමාගේ එදිනෙදා වැඩ කටයුතු තමාම කර ගැනීම හා අන් අය සමග අදහස් හුවමාරු කර ගැනීම යන කටයුතුවල දී අපහසුතා ඇති වන්නේදැයි සොයා බලන ලදී. මෙම අපහසුතා පිළිබඳ තොරතුරු "අපහසුතාවයක් නොමැත", "අපහසුය", "කිසිවක් නොහැක" යන කාණ්ඩ තුන යටතේ එක්රැස් කරන ලද අතර "අපහසුය" හා "කිසිවක් නොහැක" යන කාණ්ඩ දෙක යටතේ එක්රැස් කළ තොරතුරු ශාරීරික හා මානසික අපහසුතා ඇති මුළු පුද්ගල සංඛ්‍යාව ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නා ලදී.

මෙම තොරතුරු රැස් කිරීමේ දී කුඩා දරුවන්ගේ තොරතුරු (වයස අවු. 5ට අඩු) නිවැරදි මට්ටමින් වාර්තා නොවන බැවින් වයස අවුරුදු 5 හා ඊට වැඩි පුද්ගලයින්ගේ තොරතුරු පමණක් මෙම වාර්තාවට ඇතුළත් කරන ලදී.

### අවුරුදු 5 සහ ඊට වැඩි ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්

ජන හා නිවාස සංගණන තොරතුරු අනුව ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින් 1,617,924ක් සිටින බව වාර්තා වේ. මෙයින් වැඩිම පිරිස පෙනීමේ අපහසුතා ඇති පුද්ගලයින් (996,939) වන අතර දෙවනුව වාර්තා වී ඇත්තේ ඇවිදීමේ අපහසුතා ඇති පුද්ගලයින් (734,213) වේ. ඇසීමේ අපහසුතා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 389,077කි. මෙම තොරතුරු අනුව පුද්ගලයින් 1000කට සිටින ශාරීරික හා මානසික අපහසුතාවයට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව 87ක් පමණ වේ.

එක් එක් ශාරීරික හා මානසික අපහසුතා කාණ්ඩය අනුව පුද්ගලයින් 1000කට සිටින අපහසුතා සහිත පුද්ගලයින් සංඛ්‍යාව පහත 8.1 වගුව මඟින් දැක්වේ.


වගුව 8.1 : අවුරුදු 5 සහ ඊට වැඩි ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්, 2012

| අපහසුතාවය | ගණන | අනුපාතය (පුද්ගලයින් 1000කට) |
|---|---:|---:|
| **අපහසුතා ඇති ජනගහනය** | **1,617,924** | **87** |
| පෙනීම | 996,939 | 54 |
| ඇසීම | 389,077 | 21 |
| ඇවිදීම | 734,213 | 39 |
| මතක තබා ගැනීම | 343,689 | 18 |
| තමාගේ කටයුතු තමාම කර ගැනීම | 197,575 | 11 |
| සන්නිවේදන අපහසුතා | 180,833 | 10 |

වගුව 8.2 අනුව වයස අනුව ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳව සළකා බැලූ විට දක්නට ලැබෙන්නේ අවුරුදු 75 හා එයට වැඩි වයස් කාණ්ඩයෙන් අඩක් පමණ ශාරීරික හා මානසික අපහසුතාවයන්ට පත්ව ඇති අය බවයි. වයස අවුරුදු 70 - 74 කාණ්ඩයේ තුනෙන් එකක් පමණ හා වයස අවුරුදු 60 - 69 අතර කාණ්ඩයේ හතරෙන් එකක් පමණ ද ශාරීරික හා මානසික අපහසුතාවලින් පෙළෙන බව දැකිය හැකිය. අවුරුදු 5 - 14 අතර ළමයින් හා අවුරුදු 15 - 29 අතර පුද්ගලයින්ගේ ශාරීරික හා මානසික අපහසුතාවලින් පෙළෙන සංඛ්‍යා අනුපාතය පුද්ගලයින් 1000කට විස්සකට වඩා අඩුය. එසේම ශ්‍රම බලකායට අයත් වයසේ පසුවන පුද්ගලයින් 1000ක් අතරින් පුද්ගලයින් 62ක් පමණ ශාරීරික හා මානසික අපහසුතාවලින් පෙළෙන බව දැකිය හැකිය. වයස අවුරුදු 50 හා එයට වඩා වැඩි ජනගහනය සැලකූ විට කාන්තාවන්ගේ ශාරීරික හා මානසික අපහසුතා අනුපාතය පිරිමින්ට වඩා වැඩි බව දැකිය හැකිය.

රූපසටහන 8.1 අනුව ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්ගේ අනුපාතය (පුද්ගලයින් දහසකට) සළකා බැලීමේ දී වැඩිම අනුපාතය 101 ලෙස දක්නට ලැබෙන්නේ මහනුවර දිස්ත්‍රික්කයෙනි. එසේම නුවරඑළිය හා රත්නපුර දිස්ත්‍රික්කවලින් ද මෙම අනුපාතය 100ක් ලෙස දැකිය හැකිය. ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්ගේ අඩුම අනුපාතය 70ක් ලෙස දක්නට ලැබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එමෙන්ම මඩකළපුව හා අම්පාර යන දිස්ත්‍රික්කවල මෙම අනුපාතය පිළිවෙලින් 72 සහ 75 ලෙස දැකිය හැකිය.


**රූපසටහන 8.1 : දිස්ත්‍රික්ක අනුව ශාරීරික හා මානසික අපහසුතා සහිත ජනගහන අනුපාතය (පුද්ගලයින් 1000කට), 2012**



වගුව 8.2 : වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින් ගණන සහ පුද්ගලයින් 1000කට සිටින අපහසුතා සහිත පුද්ගලයින්ගේ අනුපාතය, 2012

| වයස් කාණ්ඩය | ශාරීරික හා මානසික අපහසුතා | | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | අනුපාතය | සංඛ්‍යාව | අනුපාතය | සංඛ්‍යාව | අනුපාතය |
| **මුළු සංඛ්‍යාව** | **1,617,924** | **86.9** | **695,263** | **77.4** | **922,661** | **95.7** |
| 5 - 9 | 31,545 | 18.0 | 16,991 | 19.3 | 14,554 | 16.8 |
| 10 - 14 | 27,527 | 16.8 | 14,910 | 18.0 | 12,617 | 15.6 |
| 15 - 19 | 29,668 | 18.0 | 15,174 | 18.5 | 14,494 | 17.6 |
| 20 - 24 | 27,810 | 18.1 | 15,050 | 20.3 | 12,760 | 16.1 |
| 25 - 29 | 29,331 | 18.9 | 16,192 | 21.8 | 13,139 | 16.2 |
| 30 - 34 | 37,773 | 23.0 | 20,231 | 25.4 | 17,542 | 20.8 |
| 35 - 39 | 44,790 | 31.8 | 22,559 | 32.9 | 22,231 | 30.7 |
| 40 - 44 | 79,712 | 58.6 | 35,173 | 53.2 | 44,539 | 63.8 |
| 45 - 49 | 125,424 | 97.5 | 54,906 | 88.8 | 70,518 | 105.6 |
| 50 - 54 | 158,085 | 129.6 | 68,472 | 117.8 | 89,613 | 140.4 |
| 55 - 59 | 177,281 | 166.6 | 76,374 | 152.5 | 100,907 | 179.1 |
| 60 - 64 | 199,663 | 217.5 | 84,588 | 198.8 | 115,075 | 233.7 |
| 65 - 69 | 183,472 | 289.7 | 75,126 | 264.7 | 108,346 | 310.0 |
| 70 - 74 | 158,864 | 385.2 | 64,236 | 353.2 | 94,628 | 410.4 |
| 75 - 79 | 140,525 | 496.2 | 53,331 | 458.2 | 87,194 | 522.8 |
| 80 සහ ඊට වැඩි | 166,454 | 608.0 | 61,950 | 572.4 | 104,504 | 631.3 |

රූපසටහන 8.2 : වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්ගේ අනුපාතය (පුද්ගලයින් 1000කට), 2012



**ශාරීරික හා මානසික අපහසුතා ඇති අයගේ අධ්‍යාපන තත්ත්වය**

අධ්‍යාපන තත්ත්වය සළකා බැලීමේ දී වගුව 8.3 අනුව පාසල් යන වයස් කාණ්ඩයේ සිටින (අවුරුදු 5-19) ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින් 88,740ක් දෙනා අතරින් 30,308ක ප්‍රමාණයක් කිසිදු අධ්‍යාපන කටයුත්තක නොයෙදීම සුවිශේෂී අවධානය යොමු විය යුතු කරුණකි. විශේෂයෙන් ම ප්‍රාථමික අධ්‍යාපනය ලැබිය යුතු වයසේ සිටින (අවුරුදු 5-9) ශාරීරික හා මානසික අපහසුතා සහිත 31,545ක් වන දරුවන්ගෙන් 6,404ක් තරම් වන ප්‍රමාණයක් එනම් සියයට 20.3ක් පමණ ප්‍රතිශතයක් අධ්‍යාපනය නොලබයි. පෙර පාසල්වල දරුවන් 2,142ක් ඉගෙනුම ලබයි. එසේම වයස අවුරුදු 10 හෝ ඊට වැඩි වයසේ පසුවන 2,076 දෙනෙකු උපාධි හෝ එයට ඉහළ අධ්‍යාපනය ලබන අය වන අතර වෘත්තීය/ තාක්ෂණික පුහුණුව ලබන්නන් 2,445ක් සිටින බව ද වාර්තා වේ.

**වගුව 8.3 : ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින් පසුගිය දින 30 තුළ නිරත වූ අධ්‍යාපන කටයුත්ත, 2012**

| වයස් කාණ්ඩය | අවුරුදු 5 හෝ ඊට වැඩි අපහසුතා සහිත මුළු ජනගහනය | නිරත වන අධ්‍යාපන කටයුත්ත | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පෙර පාසල් | පාසල් | උපාධි හෝ ඊට ඉහළ | වෘත්තීය තාක්ෂණික | වෙනත් අධ්‍යාපන ක්‍රියාකාරකම් | අධ්‍යාපන කටයුත්තක නොයෙදේ |
| **මුළු සංඛ්‍යාව** | **1,617,924** | **2,142** | **54,311** | **2,076** | **2,445** | **8,266** | **1,548,684** |
| 5 - 9 | 31,545 | 2,142 | 22,582 | - | - | 417 | 6,404 |
| 10 - 14 | 27,527 | - | 19,283 | - | 8 | 776 | 7,460 |
| 15 - 19 | 29,668 | - | 11,508 | 32 | 539 | 1,145 | 16,444 |
| 20 - 24 | 27,810 | - | 938 | 1,161 | 722 | 1,084 | 23,905 |
| 25 - 29 | 29,331 | - | - | 324 | 359 | 566 | 28,082 |
| 30 - 34 | 37,773 | - | - | 120 | 192 | 424 | 37,037 |
| 35 - 39 | 44,790 | - | - | 97 | 181 | 349 | 44,163 |
| 40 - 44 | 79,712 | - | - | 102 | 166 | 428 | 79,016 |
| 45 - 49 | 125,424 | - | - | 89 | 157 | 621 | 124,557 |
| 50 - 54 | 158,085 | - | - | 81 | 111 | 717 | 157,176 |
| 55 - 59 | 177,281 | - | - | 42 | 10 | 571 | 176,658 |
| 60 - 64 | 199,663 | - | - | 26 | - | 595 | 199,042 |
| 65 - 69 | 183,472 | - | - | 2 | - | 499 | 182,971 |
| 70 - 74 | 158,864 | - | - | - | - | 74 | 158,790 |
| 75 - 79 | 140,525 | - | - | - | - | - | 140,525 |
| 80 හෝ ඊට වැඩි | 166,454 | - | - | - | - | - | 166,454 |

**ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින්ගේ ආර්ථික ක්‍රියාකාරකම්**

වගුව 8.4හි දැක්වෙන පරිදි ශාරීරික හා මානසික අපහසුතා ඇති වයස අවුරුදු 15 හා ඊට වැඩි පුද්ගලයින් සංඛ්‍යාව 1,558,852ක් වේ. එයින් පුද්ගලයින් 453,091 (29.1%)ක් ආර්ථික කටයුත්තක යෙදෙන අතර

පුද්ගලයින් 1,105,761 (70.9%)ක් ආර්ථික කටයුත්තක නොයෙදෙන පුද්ගලයින් වේ. ආර්ථික වශයෙන් ක්‍රියාශීලී පුද්ගලයින්ගෙන් රැකියා නියුක්තිකයින් 442,138ක් වන අතර රැකියා වියුක්තිකයන් 10,953කි. එය ආර්ථික කටයුත්තක යෙදෙන අපහසුතා සහිත පුද්ගලයින්ගෙන් සියයට 2.4කි.

ආර්ථික කටයුත්තක නොයෙදෙන ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින්ගෙන් 408,253ක් ගේදොර වැඩ කටයුතු කරන අතර 530,306 ක් වැඩ කළ නොහැකි/ වයස්ගත පුද්ගලයින් වේ. එය ආර්ථික කටයුත්තක නොයෙදෙන පුද්ගලයින්ගෙන් පිළිවෙලින් සියයට 36.9ක් හා 48.0ක් වේ.

**වගුව 8.4 : ශාරීරික හා මානසික අපහසුතා සහිත පුද්ගලයින්ගේ ආර්ථික ක්‍රියාකාරකම්,** 2012

| **ආර්ථික ක්‍රියාකාරකම** | **සංඛ්‍යාව** | **%** |
|---|---|---|
| **වයස අවුරුදු 15 හා ඊට වැඩි අපහසුතා ඇති පුද්ගලයින්** | **1,558,852** | **100.0** |
| **ආර්ථික වශයෙන් ක්‍රියාශීලී මුළු සංඛ්‍යාව** | **453,091** | **29.1** |
| **ආර්ථික කටයුත්තක නොයෙදෙන මුළු සංඛ්‍යාව** | **1,105,761** | **70.9** |
| | | |
| **ආර්ථික වශයෙන් ක්‍රියාශීලී** | | |
| **මුළු සංඛ්‍යාව** | **453,091** | **100.0** |
| රැකියා නියුක්තිකයන් | 442,138 | 97.6 |
| රැකියා වියුක්තිකයන් | 10,953 | 2.4 |
| | | |
| **ආර්ථික කටයුත්තක නොයෙදෙන** | | |
| **මුළු සංඛ්‍යාව** | **1,105,761** | **100.0** |
| ශිෂ්‍ය | 22,018 | 2.0 |
| ගේදොර වැඩ කටයුතු | 408,253 | 36.9 |
| ආදායම් ලබන | 10,850 | 1.0 |
| විශ්‍රාම වැටුප් ලබන | 78,333 | 7.1 |
| වැඩ කිරීමට නොහැකි/ වයස්ගත | 530,306 | 48.0 |
| සමාජ සේවා කටයුතු | 4,376 | 0.4 |
| පාසල් නොයන ළමයා | 3,683 | 0.3 |
| වෙනත් ආර්ථික නොවන කටයුතු | 47,942 | 4.3 |